## වෙස් මුහුණු කර්මාන්තය

- මිරිස්ස ,උඩුපිල, මාතර, මහා අම්බලන්ගොඩ,බෙන්තර, දෙවුන්දර වැනි ප්‍රදේශ වෙස් මුහුණු කලාව සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.
- වෙස් මුහුණු ප්‍රධාන වශයෙන් වර්ග දෙකකි.**01. කෝලම් නාට්‍ය වෙස්මුහුණු ,02. යක් නැටුම් වෙස් මුහුණු**
- කෝලම් රඟ දක්වන්නේ වෙස් මුහුණු පැළඳගෙන ය.
- මෙහි අරමුණ වන්නේ සෞභාග්‍ය උදාකර ගැනීම හා විනෝදාස්වාදය ලබා ගැනීමයි.
- චරිත වල ඇති විශේෂ ලක්ෂණ ද වෙස් මුහුණු වලට ලබා දෙන අතර විවිධ වර්ණ,රේඛා ,හැඩතල උපයෝගී කර ගෙන වෙස් මුහුණු නිර්මාණය කරයි.වෙස් මුහුණු වර්ග කිහිපයක් නම් ලෙන්චිනා,ජසයා,අඩිගුරා ,විදානේ , නොංචි අක්කා ආදිය වේ.
- කොර සන්නිය, කණ සන්නිය,ගොළු සන්නිය, ගිණි සන්නිය, කෝල සන්නිය,දෙමළ සන්නිය යන ඒවා දහ අට සන්නි වලින් කිහිපයකි.
- දොළහ පාලිය නම් ශාන්ති කර්මය සඳහා වෙස් මුහුණු භාවිත කරයි.
- යක්ෂ මුහුණු සඳහා උදාහරණ නම් රීරි යකා, ගොපළු යකා,කළු යකා,සූනියම් යකා, ගරා යකා, අබිමානා යකා නම් වේ.
- යක්ෂ මුහුණු අතර මහා කෝල සන්නිය සඳහා පළඳින වෙස් මුහුණ විශේෂ වේ.
- වෙස් මුහුණු කැපීම සඳහා බහුලව භාවිත කරනුයේ කදුරු ලී වර්ගයයි.මේ සඳහා සැහැල්ලු ලී වර්ග යොදා ගත යුතු ය.
- රුක් අත්තන,එරබදු වැනි ලී වර්ග ද වෙස් මුහුණු කැපීමට යොදා ගනී.

## පිත්තල කර්මාන්තය

- පිත්තල කර්මාන්තයේ යෙදුණ ශිල්පීන් ලෝකරුවන් ලෙස හැඳින්වේ
- මහනුවර පිළිමතලාවේ ප්‍රදේශයේ මෙම කර්මාන්ත සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.
- වාත්තු කිරීමෙන් හා අතින් හැඩ කිරීමෙන් පිත්තල භාණ්ඩ නිපදවනු ලබයි.
- පහන්, මල්පෝච්චි,හෙප්පු,ඉර හඳ, පුන්කලස්,කුඩා ධාතු කරඬු, සරනේරු,දොර අගුල්,ඇණ වැනි විවිධ නිර්මාණ නිෂ්පාදනය කරයි.
- තඹ හා තුත්තනාගම් 2:1අනුපාතයට මිශ්‍ර කර භාණ්ඩ නිපදවයි.
- පිත්තල භාණ්ඩ සඳහා වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් හා මිලක් ඇත.